### සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ පරිපාලන නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත්ව තමන් විසින් සකස් කරගන්නාලද අයදුම් පත්‍රයක් "සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 වන මහල "ඒ" සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල" යන ලිපිනයට 2016/10/13 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපියේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

දැනට රජයේ සේවයේ නියුතු නිලධාරියෙකු / අයදුම්කරුවකුවේ නම්, ඔහු හෝ ඇය ස්වකීය අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත යොමු කළ යුතු අතර, ඔහු හෝ ඇය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලදහොත් සේවා ස්ථානයෙන් මුදා හැරිය හැකි බවට සහතිකයක් ද අයදුම්පත සමග එවිය යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධ සියලුම බලතල දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

## පරිපාලන නිළධාරී - තනතුරු 01

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම

හෝ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය ප්‍රධාන විෂයක් ලෙස (අවම වශයෙන් පාඨමාලාවෙන් තුනෙන් එකක්) අන්තර්ගත වූ කළමනාකරණ උපාධියක් ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම් ලැබූ පසු පරිපාලන ක්ෂේත්‍රයට අදාළ සේවයේ / අධිකාරියක / සංස්ථාවක / පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහකවත් පළපුරුද්දක් ලබා තිබීම.

වයස් සීමාව - 2016-10-13 දිනට අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය - රු (20,525-10X365-18X550-34,075)

රැකියාවේ ස්වභාවය - ස්ථිර සහ අර්ථසාධක සහිත

**සභාපති,**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය,**
**11 වන මහල 'ඒ' සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල,**
**දු. අ. 0112187140 / ෆැක්ස් : 0112186024**
**වෙබ් : www.nata.gov.lk**